## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ල.ගි.ප්‍ර.)

ප්‍රධාන කාර්යාලය සහ ගාල්ල, මාතර, රත්නපුර හා නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලවල දැනට භාවිතයේ පවතින රු.17,432,625 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ගිනුම්වලට ගෙන නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.6,701,825 ක්වූ ස්ථාවර වතකම් මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන යටතේ දක්වනු වෙනුවට මුදල් හා මුදල් සමාන ශේෂය යටතේ වැරදි සහගත ලෙස දක්වා තිබුණි.

(ආ) හානි වූ, යල් පැනගිය හා භාවිතයට නොගන්නා ගබඩාවේ පැවති තොග පිළිබඳ සැලකීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට අවසාන තොග වටිනාකම ගිණුම්වලට ගෙන තිබුණි.

1.2.3 නොසැසඳූ ශේෂ

මුදල් පොතේ ශේෂය හා 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුදල් ශේෂය අතර එකතුව රු.186,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) කාල විශ්ලේෂණයට අනුව පිළිවෙලින් රු.88,741,419 ක්, රු.24,778,173 ක් හා රු.52,706,575 ක්වූ ණයගැතියන්, ණය හා අත්තිකාරම් සහ ණය හිමියන් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකරගැනීමෙන් / නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ආ) ආරම්භක ශේෂයෙහි ඇතුළත් ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් රු.161,074 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි.

1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 104 (2) සහ මු.රෙ. 110 | නැතිවීම් පිළිබඳව රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපතිවරයාට වාර්තා කර නොතිබුණු අතර එම නැතිවීම් වාර්තාකර තැබීම සඳහා වෙනම ලේඛනයක් අධිකාරිය විසින් පවත්වා නොතිබුණි. |
| | (ii) මු.රෙ 1645 සහ මු.රෙ 1646 | වාහන 26 ක් සම්බන්ධයෙන් දෛනික ධාවන සටහන් වාර්තා හා මාසික කාර්යසාධන වාර්තා රෙගුලාසි ප්‍රකාරව විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 14/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | රු.1,366,000 ක් වූ පොහොර තොග ඌව ප්‍රාදේශීය කළමනාකරු විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව මිලදී ගෙන තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, අධිකාරියේ මෙහෙයුම් කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 4.4 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව, ඉකුත් වර්ෂයේ රු.මිලියන 28.4 ක ශුද්ධ ඌනතාවයක් වූ බැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 24 ක වර්ධනයක් දැක්වුණි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රු. මිලියන 37.1 කින් සෙස ආදායම වැඩිවීමයි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධන සමාලෝචනය

(අ) තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය

අධිකාරියේ 2010 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 329 ක්වූ අතර, එහිදී කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝ ග්‍රෑම් මිලියන 251.5 ක් හෙවත් 76.4% ක්විය. ඉකුත් වර්ෂයේ ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 298.8 ක් වූ අතර, කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය කිලෝ ග්‍රෑම් මිලියන 220.7 ක් හෙවත් 76.2% ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය 0.2% කින් වැඩිවී තිබුණි.

(ආ) තේ වගා සංවර්ධන පිරිවැය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ක්‍රතාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක වගා සංවර්ධන පිරිවැය සහ සංවර්ධන පිරිවැය රු.1 කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය පහත දැක්වේ.

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| සංවර්ධන පිරිවැය රු. මිලියන | 189.2 | 185.7 | 208.30 | 183.8 | 198.1 |
| ක්‍රියාත්මක කිරීමේ පිරිවැය රු. මිලියන | 205.4 | 202.1 | 188.7 | 179.0 | 186.3 |
| සංවර්ධන පිරිවැය රු.1 කට ක්‍රියාත්මක කිරීමේ පිරිවැය | 1.08 | 1.08 | .91 | 0.97 | 0.94 |

සමාලෝචිත වර්ෂය තුල තේ වගාව සඳහා ලබාදුන් සංවර්ධන පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු. මිලියන 3.5 කින් වැඩි වී තිබුණි.

(ඈ) ව්‍යාප්ත කිරීම හා උපදේශක සේවා

කුඩා තේ වතු සංවර්ධන සමිතිවලට අදාලව සහනාධාර සැපයීම, රිකිලි තේ පැල සැපයීම, පුද්ගල හා කණ්ඩායම් ගොවි පුහුණුව සහ ව්‍යාප්ත සේවා යනාදී මූල්‍ය හා ද්‍රව්‍ය සැපයුම් ඉහත උපදේශක සේවා යටතේ ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) අධිකාරයේ 2010 වර්ෂික වාර්තාවට අනුව පුද්ගල හා කණ්ඩායම් ව්‍යාප්ති සේවා 34,500 ක් ව්‍යාප්ත සේවා කාර්ය මණ්ඩලය විසින් පවත්වා තිබුණු අතර, පෙර වර්ෂය හා සැසදීමේදී එය 25.7% ක අඩුවීමක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුලදී වගාකරුවන් 210,334 ක් ව්‍යාප්ති හා උපදේශක සේවා සඳහා සහභාගී වී තිබූ අතර, එය පෙර වර්ෂය සමඟ සැසැදීමේදී 37.8% ක අඩුවීමක් විය.

(iii) ව්‍යාප්ති සේවා සම්බන්ධයෙන් ගන්නා ලද තීරණයන්ට අනුව, ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් අනුපාතය 1:1000 ක් විය යුතුය. කෙසේ වුවද, 2010 වර්ෂයේ පිළියෙල කරන ලද වාර්ෂික වාර්තාවට අනුව ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් අනුපාතය 1:2643 ක් විය. පුද්ගල වගාකරුවන් සඳහා අඩු අවධානයක් යොමු කර තිබුණු බව ඒ අනුව පෙනී යයි.

(iv) මාතර, ගාල්ල හා කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කර සිටි ව්‍යාප්ති නිලධාරීන් විසින අනුමත ණය යෝජනා ක්‍රමයට පටහැනිව තේ නැවත වගා කිරීමේ චක්‍රීය අරමුදල් බැංකු ණය රු.9,125,350 ක් නිර්දේශ කර තිබුණි.

(ඈ) පැල තවාන් මෙහෙයවීමේ කටයුතු

සමාලෝචිත වර්ෂයේදී පැල තවාන් 6 ක මෙහෙයුම්වලින් ප්‍රතිඵලය රු.236,206 ක ලාභයක් වූ අතර, ඊට එරෙහිව ඉකුත් වර්ෂයේ රු.794,281 ක පාඩුවක් වූ හෙයින් රු.1,030,487 කින් මෙහෙයුම් ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී තිස්පනේ පැල තවානෙන් රු.725,541 ක අලාභයක් සිදුවී තිබුණි.

(ii) පැල තවාන් ගිණුම්වලට අනුව, සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරියේ පැල තවාන් 6 ක පැල 155,699 ක් මැරී තිබුණු අතර, එය මුළු පැල සංඛ්‍යාවෙන් 11.2% ක් විය.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී නෙල්ලිගොල්ල පැල තවාන ක්‍රියාත්මකව නොතිබුණි.

(ඉ) තේ පොහොර බෙදාහැරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී කුඩා තේ වතු හිමියන්ට ලබාදුන් පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 123,244 ක් වූ අතර, එය පෙර වර්ෂය හා සැඳීමේදී මෙට්‍රික් ටොන් 12,484 කින් එනම් 9.2% කින් අඩුවී තිබුණි.

(ii) තේ පොහොර බෙදා හැරීමේ ගිණුම අනුව, සමාලෝචිත වර්ෂය තුලදී පොහොර මධ්‍යස්ථාන 6 කින් රු.161,831 ක සමස්ථ පාඩුවක් සිදුවී තිබුණු අතර පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එය රු.1,535,715 කින් එනම් 112% කින් අඩුවී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුලදී ගම්පොළ හා ගිනිගත්හේන පොහොර මධ්‍යස්ථානවලින් පිළිවෙලින් රු.190,017 කින් හා රු.62,427 කින් පාඩු සිදුවී තිබුණු අතර, ගිනිගත්හේන පොහාර මධ්‍යස්ථානය පෙර වර්ෂයේ සිටම පාඩු ලබා තිබුණි.

(iv) දැරණියගල පොහොර මධ්‍යස්ථානයේ රු.63,114 ක් වටිනා කිලෝ ග්‍රෑම් 3350 ක පොහොර තොග සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට නිෂ්කාර්යව පැවතුණි. කෙසේ වුවද, මෙම මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂයේදී වසා දමා තිබුණි.

(ඊ) එළදා පුනරුත්ථාපන සහනාධාර යෝජනා ක්‍රමය

නිර්දේශිත කප්පාදු කිරීමේ ක්‍රම යොදා ගැනීම, අඩු තැන්වලට පිරවීම, පස් සංරක්ෂණ ක්‍රියාමාර්ග පුනරුත්ථාපනය (කාණු පද්ධති හා ගල් තට්ටු) සහ ආවරණ කළමනාකරණය (ආවරණ, කප්පාදු කිරීම හා වල් ඉදිරීම) මෙම සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

2010 වාර්ෂික වාර්තාවට අනුව, මෙම යෝජනා ක්‍රමය යටතේ පැල 424,227 ක් සඳහා පළමු වාරිකය ගෙවා තිබුණු අතර, එය පෙර වර්ෂය සමඟ සැසැදීමේදී 2% කින් අඩුවී තිබුණි. එහෙත් දෙවන වාරිකය පැල 254,715 ක් සඳහා ගෙවා තිබුණු අතර, එය පෙර වර්ෂය සමඟ සැසදීමේදී 10% ක වැඩිවීමක් විය. සමාලෝචිත වර්ෂය තුලදී සිදු කරන ලද මුළු සහනාධාර ගෙවීම් රු. මිලියන 3.59 ක් වූ අතර එය ඉලක්කයෙන් 72% ක් විය.

2.3 වත්කම් කළමනාකරණය

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නුවරඑළිය, කෑගල්ල හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලවල ජංගම බැංකු ගිණුම් 03 ක සමාලෝචිත වර්ෂය තුල කිසිදු ගනුදෙනුවක් සිදු නොකර 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.943,062 ක්වූ බැංකු ශේෂ නිශ්කාර්යව පැවතුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ රු.10,756,272 ක් වටිනාකම වූ ආරම්භක ලිපි ද්‍රව්‍ය තොග ශේෂයක් පැවතුණද, රු.2,610,530 ක් වටිනාකම වූ තොග පමණක් සමාලෝචිත වර්ෂය තුල පරිභෝජනය කර තිබුණි. කෙසේ වුවද, පවත්නා තොගය පිළිබඳ විමසා බැලීමකින් තොරව පවතින තොගයට අමතර වශයෙන් රු.2,330,570 ක් වටිනා තොග සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණි.

(ඇ) කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් රු.2,850,000 ක මුදලක් සපයා තිබුණද, සමාලෝචිත වර්ෂය තුලදී කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය විසින් රු.1,342,710 (47%) පමණක් උපයෝජනය කර ඉතිරි මුදල ආපසු යවා තිබුණි. එසේම එම වැඩසටහන විසින්ම නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයට සපයන ලද අරමුදල්වලින් රු.2,912,426 ක මුදලක් අරමුණු කල කාර්යයන් සඳහා යොදා ගැනීමකින් තොරව ආපසු යවා තිබුණි.

2.4 හඳුනාගන්නා ලද පාඩු

-------------------------

තොග සමීක්ෂණ වාර්තාවලට අනුව ගම්පොළ, සරසවි උයන, හිඟුල, බණ්ඩාරවෙල, පස්සර හා හාලි ඇල පොහොර බෙදාහැරීමේ මධ්‍යස්ථානවල 2010 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත නොහැකි පොහොර තොග කිලෝ ග්‍රෑම් 13,214 ක් විය.

2.4 පාරිතෝෂික ප්‍රතිපාදන ආයෝජනය කිරීම

රු.97,275,563 ක්වූ පාරිතෝෂික ගෙවීම සඳහා වූ මුළු ප්‍රතිපාදනයෙන් රු.6,701,825 ක මුදලක් එනම් 6.89% ක් පමණක් 2011 අගෝස්තු 31 වන විට ආයෝජනය කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව අනාගත බැරකම්වලට මුහුණදීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ආයෝජනය කර නොතිබුණි.

2.6 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

2008 වර්ෂයේදී ලොරි රථයක් කල්බදු පදනම යටතේ මාසික බදු කුලිය රු.15,000 කට තේ ශක්ති අරමුදලේ කම්හලකට සපයා තිබුණි. කෙසේ වුවද තේ ශක්ති අරමුදල විසින් 2008 වර්ෂයේ මාස දෙකක් සඳහා පමණක් එකතුව රු.30,000 ක බදු කුලී ගෙවා තිබුණු අතර, තවදුරටත් ලැබිය යුත මුදල් කිසිවක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරියට ගෙවා නොතිබුණි.

3. අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

4. පද්ධති හා පාලන.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ආ) තොග
(ඇ) මුදල් කළමනාකරණය
(ඈ) බැංකු සැසඳුම්
(ඉ) සහනාධාර ගෙවීම